ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

ශ්‍රී ලංකා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමා සමඟ ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා විසින් සිදු කළ මාධ්‍ය ප්‍රකාශය

**(2025 දෙසැම්බර් 23)**

ශ්‍රී ලංකා විදේශ අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමනි,

මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමනි,

අප දූත පිරිස් දෙකෙහි සාමාජිකයිනි,

මාධ්‍ය ක්ෂේත්‍රයේ මිතුරනි,

සුභ උදෑසනක්, නමස්කාර්, ආයුබෝවන්, වණක්කම්!

ඔබ සැම දන්නා පරිදි මා මෙහි පැමිණ තිබෙන්නේ අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ විශේෂ නියෝජිතයකු ලෙස අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට පණිවිඩයක් රැගෙන යි. ජනාධිපතිතුමා අද උදෑසන මා පිළිගත් අතර අප දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ හානිය පිළිබඳව සවිස්තරාත්මක සාකච්ඡාවක නිරත වුණා. මා විසින් භාර දුන් අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාගේ ලිපිය පළමු ප්‍රතිචාරකයා ලෙස අපගේ භූමිකාව ඉදිරියට ගෙන යමින් ශ්‍රී ලංකාවට ඇමරිකානු ඩොලර් මිලියන 450ක නැවත ඉදිකිරීමේ පැකේජයක් ලබා දීමට කැප වෙනවා. අපගේ සාකච්ඡාවන් කේන්ද්‍ර වූයේ මෙම කැපවීම කෙතරම් කඩිනමින් ක්‍රියාවට නැංවිය හැකි ද යන්න පිළිබඳව යි.

2. ඔබගේ සමීපතම අසල්වැසියා ලෙස සහ අපගේ අසල්වැසියා ප්‍රථමයෙන් සහ මහාසාගර් යන ප්‍රතිපත්තීන්ට අනුව ඔබ අර්බුදයකට මුහුණ දෙන අවස්ථාවක දී සහයට පැමිණීම ස්වභාවිකවම සිදු වන්නක්. ඔබ ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දුන්

අවස්ථාවේ ද අප එලෙසම කටයුතු කළා. දිට්වා සුළි කුණාටුව යන කාරණයේ දී ඉන්දියාව සහයෝගී ආපදා ප්‍රතිචාර සඳහා ප්‍රබල හඬක් නැගූ රාජ්‍යයක් ද වීම ඔබ අගය කරනු ඇති. අප විසින් නායකත්වය ගත් ආපදා ප්‍රත්‍යාස්ථිත යටිතල පහසුකම් සඳහා වන සන්ධානය මෙහි ලා වැදගත් මුලපිරීමක් වුණා.

3. ඉන්දියාවේ සහන සහ ආධාර මෙහෙයුම වන සාගර් බන්ධු මෙහෙයුම ශ්‍රී ලංකාව දිට්වා සුළි කුණාටුවට මුහුණ දුන් පළමු දිනයේ ම ආරම්භ වුණා. කොළඹට පැමිණ තිබූ අපගේ ගුවන් යානා ප්‍රවාහන නෞකාවක් වන INS වික්‍රාන්ත් නෞකාව සහ තවත් නෞකාවක් වන INS උදයගිරි නෞකාව විසින් සහනාධාර ලබා දුන් අතර ඉන් අනතුරුව හෙලිකොප්ටර් යානා ද යෙදවූවා. ඉන් අනතුරුව ඉන්දීය ගුවන් හමුදාවේ Mi-17 හෙලිකොප්ටර් යානා ගණනාවක් දසෙතියකට අධික කාලයක් පුරා සක්‍රීයව ශ්‍රී ලංකාවේ සහන මෙහෙයුම් සඳහා දායක වුණා. මේ හා සමගම ජාතික ආපදා ප්‍රතිචාර බලකායේ 80 දෙනෙකුගෙන් සමන්විත බලඇණියක් ශ්‍රී ලංකාවට පැමිණ මුදවා ගැනීමේ සහ සහන මෙහෙයුම් සිදු කළා. ඉන්දීය යුධ හමුදාව පුද්ගලයන් 8000කට වැඩි පිරිසකට හදිසි ප්‍රතිකාර ලබා දෙමින් වෛද්‍ය කාර්ය මණ්ඩලයේ 85 දෙනෙකුගෙන් සමන්විත ක්ෂේත්‍ර රෝහලක් මහනුවර අසල ස්ථාපනය කළා. BHISHM හදිසි ප්‍රතිකාර ඒකක දෙකක් ද ගුවනින් ශ්‍රී ලංකාවට රැගෙන ආ අතර ඒවා ද වෛද්‍ය පහසුකම් ලබා දීම සඳහා ස්ථාපනය කළා.

4. විනාශයේ ප්‍රමාණය පිළිබඳව සැලකීමේදී, මාර්ග සම්බන්ධතා ප්‍රතිස්ථාපනය කිරීම පැහැදිලිවම හදිසි ප්‍රමුඛතාවයක් වූ අතර ඇත්තෙන්ම මෙම කරුණ අතිගරු දිසානායක ජනාධිපතිතුමා සහ අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා අතර පැවති දුරකථන ඇමතුම අතරතුර සාකච්ඡා කෙරුණා. හේරත් අමාත්‍යතුමා සඳහන් කළ පරිදි යුධ හමුදා ඉංජිනේරුවන් විශාල පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් C-17 ගුවන් යානයක් විසින් ගෙන එන ලද බේලි පාලමක් කිලිනොච්චියේ ස්ථාපනය කළා. තවත් බේලි පාලමක් හලාවත ඉදි වෙමින් පවතිනවා. සමස්තයක් ලෙස සාගර් බන්ධු මෙහෙයුම යටතේ වියළි සලාක, කූඩාරම්, ටාපොලින්, සනීපාරක්ෂක කට්ටල, අත්‍යවශ්‍ය ඇඳුම් සහ ජල පිරිපහදුකරණ කට්ටල ඇතුළු ටොන් 1100කට අධික සහනාධාර ලබා දී තිබෙනවා. ටොන් 14.5ක පමණ ඖෂධ සහ වෛද්‍ය උපකරණ ද සපයා තිබෙනවා. සහන මෙහෙයුම්වලට උපකාර කිරීම සඳහා තවත් ටොන් 60ක පමණ උපකරණ ද ශ්‍රී ලංකාවට ගෙනැවිත් තිබෙනවා.

5. යළි ගොඩනැඟීමේ හදිසි අවශ්‍යතාවය හඳුනාගනිමින් අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා දැන් අප ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතාවයන් සපුරාලීම සඳහා ශ්‍රී ලංකා රජය සමඟ තියැලිය යුතු බවට උපදෙස් දුන්නා. අප විසින් යෝජනා කර තිබෙන ආධාර පැකේජයේ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 450 ක්. එයට ඇමරිකානු ඩොලර් මිලියන 350ක ණය සහනාධාර සහ ඇමරිකානු ඩොලර් මිලියන 100ක ප්‍රදාන ඇතුළත් වනු ඇති. මෙම පැකේජය පිළිබඳ කරුණු කාරණා ශ්‍රී ලංකා රජය සමඟ සමීප සාකච්ඡාවන් සිදු කරමින් අවසන් වෙමින් පවතිනවා. අපගේ ආධාර තුළින් පහත දැක්වෙන අංශ ඇතුළු සුළි කුණාටුවෙන් වඩාත්ම බලපෑමට ලක් වූ අංශයන් ආවරණය කරනු ඇති:

(i) මාර්ග, දුම්රිය මාර්ග සහ පාලම් සම්බන්ධතා පුනරුත්ථාපනය සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම;

(ii) සම්පූර්ණයෙන් විනාශ වූ හා අර්ධ ලෙස හානි වූ නිවාස ඉදි කිරීම සඳහා සහය;

(iii) විශේෂයෙන්ම සුළි කුණාටුව හේතුවෙන් හානියට පත් සෞඛ්‍ය සහ අධ්‍යාපන පද්ධතීන්ට සහය;

(iv) කෙටි සහ මධ්‍ය කාලීනව ඇති විය හැකි හිඟයන් සපුරා ගැනීම සඳහා සහයෝගය ඇතුළුව කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා සහය සහ

(v) වඩා හොඳ ආපදා ප්‍රතිචාර සහ සූදානම සඳහා කටයුතු කිරීම.

6. දිට්වා සුළි කුණාටුවෙන් ශ්‍රී ලංකාවේ ජනතාවට සිදු වූ බලපෑම සමනය කිරීමේ කටයුතු හැකිතාක් අවම කාලයකින් සිදු කළ යුතු බව අපගේ හැඟීම යි. මෙය හැකි

ඉක්මනින් ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි සම්බන්ධීකරණ ක්‍රමවේදයක් පිළිබඳව අප සාකච්ඡා කරමින් සිටිනවා.

**7.** එසේම, ඉන්දියාවට ශ්‍රී ලංකාවට සහය විය හැකි සහ ඉන්දියාව ශ්‍රී ලංකාවට සහය වනු ඇති තවත් ආකාර තිබෙන බව ද මා සඳහන් කිරීමට කැමතියි. ශ්‍රී ලංකාව සැලකිය යුතු ලෙස සංචාරක ආර්ථිකයක් වන අතර අමාත්‍යතුමනි, අප ඉන්දිය සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණීමට දිරිමත් කිරීම සඳහා තවදුරටත් අඛණ්ඩව කටයුතු කරන බව ඔබට සහතික කිරීමට කැමතියි. එසේම, ඉන්දියාවෙන් ලැබෙන ඍජු විදේශ ආයෝජන ඉහළ යාමක් තීරණාත්මක අවස්ථාවක දී ඔබගේ ආර්ථිකය නංවාලීමට ද හේතු විය හැකියි. එබැවින් අපගේ සාකච්ඡා අප දෙරට අතර වඩා ගැඹුරු සහයෝගී සම්බන්ධතාවයක් ප්‍රවර්ධනය කිරීම යන කාරණය පිළිබඳව අවධානය යොමු කරනු ඇති.

**8.** මිත්‍රවරුනි, මෙය ශ්‍රී ලංකාවට ඉතා අසීරු කාල සීමාවක් බව අප හොඳින් හඳුනාගෙන තිබෙනවා. ශ්‍රී ලංකාව **2022** වසරේදී මුහුණ දුන් ආර්ථික අර්බුදයෙන් යථා තත්ත්වයට පත් වන අවස්ථාවේදී මෙම ස්වභාවික ව්‍යසනය නව දුෂ්කරතා නිර්මාණය කර තිබෙනවා. මෙවැනි අභියෝග ජය ගනිමින් ඉදිරියට පිය නැගීමට ශ්‍රී ලංකාවේ ජනතාව සතු අධිෂ්ඨානය සහ ශක්තිය අප අතීත අවස්ථාවන්හිදී දැක තිබෙනවා. ඉන්දියාව අන් කවරදාටත් වඩා ශ්‍රී ලංකාව සමඟ ශක්තිමත්ව රැඳී සිටින බවට මට ඔබට සහතික විය හැකි අතර ශ්‍රී ලංකාව මෙම ආපදාවෙන් යථා තත්ත්වයට පත් වීමේදී නැවත වරක් සිය සුවිසල් ඔරොත්තු දීමේ හැකියාව ප්‍රදර්ශනය කරනු ඇති බව මට විශ්වාසයි.

**9.** ස්තුතියි.

***

**කොළඹ**
**2025** දෙසැම්බර් **23**

**මූලාශ්‍රය:**
https://www.mea.gov.in/Speeches-Statements.htm?dtl/40557/Press_Statement_by_EAM_during_meeting_with_Foreign_Minister_Vijitha_Herath_of_Sri_Lanka